( 23 )

# ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන අවධියේ කාසි

ඩබ්.එම්. චින්තක සඳරුවන්
සිව්වන වසර
chinthakasandaruwan13@gmail.com

**අභිමුඛය.**

ශ්‍රී ලංකාවේ මුල්‍ය ඒකකය රුපියල් ශත ලෙස හැඳින්විය හැකි අතර මෙම ක්‍රමය ආරම්භ වන්නේ 1872 ජනවාරි 1වන දින සිට යි. එසේ වුව ද ක්‍රිපු 3වන සියවසේ සිට වර්තමානය දක්වා අවුරුදු දෙදහසකට අධික කාලයක් පුරාවට ශ්‍රී ලංකාව තුළ කාසි භාවිත කළ බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂි අප සතුව පවති. ලංකව තුළ විවිධ ප්‍රදේශ තුළින් පැරණි දේශීය හා විදේශීය කාසි විශාල වශයෙන් හමුවන අයුරු දක ගත හැකි වේ. ලංකාවේ අතීතයේ දි ගනදෙනු අවශ්‍යතා සඳහා මුදල් භාවිත කළ බව සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව පැහැදිලි වේ. මෙම මුදල් භාවිතය සම්බන්ධයෙන් වන පැරණිතම සාධක ක්‍රි.පු. 3වන සියවස දක්වා දිවෙයි. අනුරාධපුර මුල් යුගයේ සිටම කහවණු, හස්ඵබු කාසි, ලක්ෂමි කාසි, ස්වස්තික කාසි භාවිත වේ. අනුරාධපුර යුගයෙන් පසුව කාසි භාවිතය වර්ධනය වන අතර පොළොන්නරු යුගයෙන් පසුව භාවිත කාසි පිළිබඳව සොයා බැලිම ඉතා වැදගත් වේ.

අනුරාධපුර යුගය චෝල ආක්‍රමණ හමුවේ ක්‍රිස්තු වර්ෂ 1029 දී බිඳ වැටෙන අතර පසුව අඩ සියවසකට වැඩි කාලයක් සොළී පාලනයක් ලංකාව තුළ ක්‍රියාත්මක වේ. එම යුගය තුල දී සොළි කාසි මෙ රට භාවිතයට ගෙන ඇත. සොළි පාලනය පළමුවන විජයබාහු රජු (ක්‍රි.ව 1055-1110) බිඳ දැම්මත් සමග නැවත දේශිය මුලයකට රාජ්‍යත්වය හිමිවු අතර මුදල් භාවිතය පෙර සොළි කාසියේ ලක්ෂණවලින් යුතුව දේශිය රාජ්‍ය නාමය යොදා සකස් කොට භාවිතයට ගනි. ශ්‍රි ලංකාවේ මධ්‍ය කාලින යුගය හෙවත් පොළොන්නරු - දඹදෙණි යුගයට අයත් කාසි **සිංහල තඹ මස්ස, සිංහල මසු, දඹදෙණි කාසි** ලෙස විවිධ නම් වලින් හදුන්වනු ලැබේ. ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් මෙම වර්ගයේ කාසි හමුවී ඇත. රජවරුන් හය දෙනෙකුට විසින් මෙම කාසි විශේෂය නිකුත් කර ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක වේ (පරණවිතාන, 2012: 44).

මෙම අවධියේ කාලිවල පොදු ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. කාසියේ අභිමුඛයේ හිටි පුද්ගල රුවකි. ඔහු නෙළුම් දණ්ඩක් මත සිටගෙන සිටි ශිර්ෂාභරණ, නාසය, මුඛය, නළල හා හිස ශෛලිගතව දෙයාකාරව දක්වා ඇත. වම් අත වැළම්ටෙන් නවා අත්ල දිගහැර මුව දෙසට හරවාගෙන සිටින අයුරු දක්වයි. වම් අතට පහළින් බිංදු පහකින් යුත් සළකුණකි. වම් අතෙහි මල් පොහොට්ටුවක් ආකාරයට වන ස්වස්ථිකය වේ. දකුණු අත පහළට හෙළා ඇති අතර එයින් යමක් අල්ලාගෙන සිටී. පුද්ගල රුවෙහි යටිකය භාරතීය ඇඳුමක් වන ධෝතියක් බඳු ඇඳුමකින් සරසා ඇත. මෙම සංකේත සියල්ලම මැදිකොට කාසි වටා කුඩා බිංදු සළකුණු දකගත හැකි ය (වික්‍රමසිංහ, 1999: 19-20).

ප්‍රතිමුඛයෙහි හිඳි පුද්ගල රුවකි. මුහුණ නාසය ශිර්ෂ ආභරණ අභිමුඛයට සමානය. හිඳ සිටින අසුන එකිනෙක කැපුනු රේඛා දෙකකින් හෝ තුනකින් සමන්විත ය. මෙය ලකුණක් ලෙස ද හැඳින්විය හැකි ය. දකුණු අත නවාගෙන සිටින අතර වම් අතට පහළින් නාගරී අක්ෂර පාඨයකි (එම). මෙම කාසිවල ඇති සංකේත ක්‍රි.ව. 5-11 සියවස් අතර කාලය තුළ මෙරට භාවිතයේ පැවති රන් කහවනු නමින් හඳුන්වන කාසිවලට සමාන වේ. එහෙත් මෙම කාසිවල එතරම්ම පිරිපුන් බවක් නොමැත. එසේ ම රන් කහවනුවල ඇති " ශ්‍රී ලංකා වෙහ" හෝ "විහ" යන්න වෙනුවට මෙම කාසිවල මස්ස කාසි නිකුත් කළ රජුගේ නම සඳහන් වීම සුවිශේෂයකි. එම නිසා කාසි නිකුත් කළේ කුමන රජු ද යන්න නිශ්චිත ව ම හඳුනාගත හැකි ය. මධ්‍ය කාලීන කාසි නිකුත් කළ රජවරු කිහිප දෙනෙකු පිළිබඳව තොරතුරු මුලාශ්‍ර අධ්‍යනයෙන් පැහැදිලිව දැකගත හැකි ය.

| රජුගේ නාමය | රාජ්‍ය වර්ෂය | කාසියේ සටහන් කර ඇති නාමය |
|---|---|---|
| පළමුවන විජයබාහු රජු | (ක්‍රි.ව 1055-1110) | ශ්‍රී විජයබාහු |
| පළමුවන පරාක්‍රමබාහු රජු | ( ක්‍රි.ව 1153-1186) | ශ්‍රී පරාක්‍රමබාහු |
| නිශ්ශංකමල්ල රජු | ( ක්‍රි.ව 1187-1196) | ශ්‍රී කලිගලකේජ |
| චෝඩගංග රජු | ( ක්‍රි.ව 1196-1197) | ශ්‍රී චෝඩගංගදේව |
| ලීලාවති රැජින | ( ක්‍රි.ව 1197-1200/1209-1210/1211-1212) | ශ්‍රී රාජලීලාවති |
| සහස්සමල්ල රජු | ( ක්‍රි.ව 1200-1202) | ශ්‍රීමත් සහාසමල්ල |
| ධර්මාශෝකදේව රජු | ( ක්‍රි.ව 1208-1209) | ශ්‍රී ධර්මාශෝකදේව |
| දෙවන පරාක්‍රමබාහු රජු | ( ක්‍රි.ව 1236-1270) | ශ්‍රී පරාක්‍රමබාහු |
| හතරවන විජයබාහු රජු | ( ක්‍රි.ව 1270-1272) | ශ්‍රී විජයබාහු |
| පළමුවන බුවනෙකබාහු රජු | ( ක්‍රි.ව 1272-1284) | ශ්‍රී බුවනෙකබාහු |

(කුලතුංග, 2002: 97-99) හා (සුරවීර, 1997: 116-117)

මධ්‍ය කාලීන යුගය ලෙස සැළකෙන පොළොන්නරු යුගය හා ඉන්පසු යුගය ලංකාවේ කාසි නිකුත් කිරිම සම්බන්ධයෙන් වැදගත් යුගයකි. ක්‍රි.ව. 1017 දි පමණ රජරට බලය සොළින්ට නතුවන අතර පොළොන්නරුව ඔවුන්ගේ පාලන මධ්‍යස්ථානය කර ගනිමින් **මුම්මඩි චෝලමණ්ඩලම්** (ධම්මවිසුද්ධි හිමි, කරුණානන්ද, 2004: 366) ලෙස එය නම් කරයි. ඒ අනුව සොළින් අවුරුදු 53ක් පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කරගෙන පාලනය ගෙනයයි. මෙම යුගයේ සොළී පාලකයින් ඔවුන්ගේ නම්වලින් කාසි නිකුත් කර ඇත. ඒ අතර **පළමුවන රාජරාජ** (ක්‍රි.ව. 985-1014), **පළමුවන රාජාධිරාජ** (ක්‍රි.ව. 1012/14-1044), **පළමුවන රාජේන්ද්‍රචෝල** (ක්‍රි.ව.

1050-1110) (එම: 364-368) ආදි පාලකයන් වැදගත් වේ. මෙම යුගයෙන් පසුව **පළමුවන විජයබාහු රජු** (ක්‍රි.ව. 1055-1110) සොළින් පළවාහැර පොළොන්නරු රාජ්‍ය අත්පත් කර ගනි (මහා වංසය. 58:115). ඔහු විසින් සොළී පාලනයෙන් ඇතිවූ අනිටු විපාක මගහැරීම සඳහා විවිධ කටයුතු සිදු කරන ලදි. වාරි කර්මාන්ත හා වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය ඒ අතර වැදගත්ව ඇත (එම). මෙම පාලන යුගයේ එතෙක් භාවිත කළ සොළී කාසි වෙනුවට නව කාසියක් දේශීය අනන්‍යතාවයකින් යුක්තව නිකුත් කරයි. මොහු විසින් **'ශ්‍රී විජයබාහු'** (කුලතුංග, 2002: 96) අභිධාන යෙදූ දේශීය කාසි නිකුත් කළ බව පෙනේ. මෙහිදී විජයබාහු රජු සිදුකර ඇත්තේ සොළී අධිරාජ්‍යයේ කාසිය වෙනස් නො කර කර එහි වූ සොළී අධිරාජයාගේ නම වෙනුවට 'ශ්‍රී විජයබාහු' නම් ස්වකීය නාමය යෙදීම පමණි. මෙම කාසිවල ගොරහැඩි බව හා අක්ෂරයන්ගේ විශාලත්වය සොළී කාසිවලට සමාන වේ. මොහු විසින් තඹ, රන් හා රිදියෙන් ද කාසි නිකුත් කර ඇත (එම: 99). අභිධානය සටහන් කිරීමේ දි අක්ෂර නාගරී අක්ෂර යොදා ගෙන ඇත.

පළමු විජයබාහු රාජ යුගයෙන් පසුව නැවත ලාංකීය දේශපාලනය තරමක් දුරට අස්ථාවර වීමක් හඳුනාගත හැකි ය. ඔහුගෙන් පසුව පළමුවන ජයබාහු (ක්‍රි.ව. 1110-1111), දෙවන වික්‍රමබාහු ( ක්‍රි.ව. 1111- 1132), දෙවන ගජබාහු ( ක්‍රි.ව. 1132- 1153) (සුරවිර,1997: 116) රජකම් දරණු ලබන අතර කාසිවල වෙනසක් හෝ අච්චු ගැසීමක් සිදුවූ බවට සාධක නො වේ.

මධ්‍ය කාලීන කාසි නැවත නිකුත් කිරීම සිදුවන්නේ රටේ පැවති අස්ථාවර තත්ත්වයෙන් රට මුදවා ගත් මහ පැරකුම්බා රාජ සමයේ දී ය. **සකළ සිංහල චක්‍රවර්ති** (කුලතුංග, 2002: 101) නැමති උපාධි නාමය සහිතව මෙහු දේශපාලනික වශයෙන් ස්ථාවරභාවයකින් කටයුතු කළ බව පෙනේ. විජයබාහු රජුගේ කාසි අනුගමණය කරමින් ශ්‍රී විජයබාහු යන්න වෙනුවට **'ශ්‍රී පරාක්‍රමබාහු'** (එම) පාඨය යොද කාසි නිකුත් කර ඇත. මෙම රජුගේ ලංකාපුර සෙනවියා විසින් පඩි රට ජය ගැනීමෙන් පසුව පරාක්‍රබාහු රජුගේ නම යොදා කර්ෂාපන හෙවත් කහවනු නිකුත් කළ බව මහාවංසයේ ද සඳහන් වේ. (මහා වංසය. 78: 276-277) මෙම කහවනු පරාක්‍රමබාහු නම සඳහන් මස්ස කාසි විය හැකි ය. මෙම යුගයෙන් පසුව නැවත කාසි නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ හයවන මහින්දගෙන් (ක්‍රි.ව. 1187) (සුරවිර, 1997: 116) පසුව රාජ්‍ය බලයට පත්වන **කිර්ති ශ්‍රී නිශ්ශංකමල්ල** (ක්‍රි.ව. 1187-1196) රජුගේ කාලයේ දී ය. මහ පැරකුම් රජගෙන් පසුව රටේ නැවත දේශපාලන ස්ථාවරත්වයක් ඇති වන්නේ මෙම යුගයේ දී ය. සොළී පාලක කාසිවලට පසුව විවිධ රජවරුන් එම කාසිවලට සමාන ලෙස ප්‍රතිමුඛයේ අභිෂේක නාමය සඳහන් කර ඇතත් නිශ්ශංක මල්ල රජු මෙයට වෙනස් ක්‍රමයක් භාවිත කරමින් කාසි නිකුත් කර ඇත.

ඔහු විසින් පෙර තිබූ කාසිවල භෞතික ස්වරූපය වෙනස් නො කොට තම වංශය සම්බන්ධ කොට භාවිත කළ උපාධි නාමය වූ **කාලිංග ලංකේන්ද්‍ර** යන අර්ථය දෙන **'කලිග ලකෙජ'** (කුලතුංග, 2002: 101) යන පාඨය අභිෂේක නාමය වෙනුවට යොද ඇත. නිශ්ශංකමල්ල වූ කලි කාලිංගයෙන් පැමිණි කාලිංගයෙකු වන අතර මේ වන විට මෙරට රාජ්‍ය බලය හිමි කර ගැනීමට මෙරට රජ පවුලේ පාණ්ඩ්‍ය වංශයත්, ගොවිකුල වංශයකුත් සිටි බව පෙනේ. මෙම නිසා තම විදේශියත්වය හා වංශ පරම්පරාව සැඟවීමට නො හැකි වූ නිසාවෙන් නිශ්ශංකමල්ල රජු සිදු කර ඇත්තේ කාලිංග වංශය වඩාත් වැදගත් කොට දක්වමින් කාලිංග වංශයට සිහසුන දැරීමට වඩාත් ප්‍රබල උරුමයක් ඇති බව දැක්වීමට කටයුතු කිරීමයි. ඔහු තම නාමය සඳහන් සෑම අවස්ථාවක

දිම කාලිංග වංශය උසස් කොට දක්වමින් කාලිංග චක්‍රවර්ති, කාලිංග ලංකේන්ද්‍ර ආදි ලෙස දක්වයි. ශ්‍රී කාලිංග ලංකේන්ද්‍ර යන්න යොදා ගනිමින් සිහසුන සඳහා කාලිංග වංශිකයන්ට උරුමයක් ඇති බව පෙන්වා දිමට මෙමගින් උත්සහකර ඇත.

මෙම රාජ්‍ය පාලනයෙන් පසුව ද නැවත රටෙහි ක්‍රමික දේශපාලන අස්ථාවරත්වයක් ඇති වන අතර මෙම යුගයේ **වීරබාහු** (ක්‍රි.ව. 1196), **තුන්වන වික්‍රමබාහු** (ක්‍රි.ව. 1196) (සුරවීර, 1997: 116) යන පාලකයන් පාලනය කරයි. මෙම යුගය තුළත් කාසි නිකුත් වූ බවට සාධක නොවන අතර පෙර භාවිතයේ පැවති කාසි මේ අවධියේදී ද භාවිතයට ගන්නට ඇතැයි සිතිය හැක. පසුව කාසි නිකුත් කිරිම  සිදු කරනු ලබන්නේ **චොඩගංගදේව** (ක්‍රි.ව. 1196-1197) රාජ යුගයේ දී ය. ඔහු විසින් **'ශ්‍රී චොඩගංගදේව'** (කුලතුංග, 2002: 102) යනුවෙන් සිය අභිෂේක නාමය යොදා කාසි නිකුත් කර ඇත. මෙම කාසිය ද පෙර පරිදි ම කාසි අනුකරණය කොට නිර්මාණය කොට ඇති අතර රාජකීය නාමය පමණක් වෙනස් කොට ඇත.

මෙම රජුගෙන් පසුව **කිත්ති** නම් සෙනවියකු විසින් සිදු කළ කුමන්ත්‍රනයක් තුළින් මහා පරාක්‍රමබාහු රජුගේ බිසවක් වූ **ලීලාවතිය** (ක්‍රි.ව. 1197-1200) රජකමට පත් කරයි (මහා වංසය. 80: 292). ඇය තෙවරක් ලංකාව තුළ රජ වි ඇත. ( ක්‍රි.ව 1197-1200/1209-1210/1211-1212) ඇයගේ පළමු රාජ්‍ය කාලය අවුරුදු තුනකට සීමා වූ අතර ඉතිරි රාජ්‍ය කාල ඉතාම කෙටි විය. ඇයද පෙර පරිදිම නාගරි අක්ෂර යොදගෙන **'ශ්‍රී රාජ ලීලාවති'** (කුලතුංග, 2002: 103) ලෙස සිය නාමය සඳහන් කරමින් කාසි නිකුත් කර ඇත. මෙම කාසිවල විශේෂත්වය වනුයේ අනෙකුත් පාලකයන්ගේ කාසිවලට වඩා මෙම කාසියේ **'ශ්‍රී'** අක්ෂය හා පුද්ගල නාමය අතරට **'රාජ'** යන පාඨය ඇතුලත්ව තිබිමයි.

පසුව ඈ නෙරපා දමා කාලිංග පාක්ෂිකයෝ ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ ඥාති සහෝදරයකු වූ **සහස්සමල්ල** (ක්‍රි.ව. 1200-1202) (මහා වංසය. 80: 292) රජ කරවයි. ඔහු විසින් ද කාසි නිකුත් කළ අතර එම කාසියෙහි **'ශ්‍රීමත් සහාස්සමල්ල'** (කුලතුංග, 2002: 103) යන නම යොද ඇත. මෙම කාසියේ විශේෂත්වය වනුයේ කාසියට 'ශ්‍රීමත්' යන පාඨය යොද තිබිමයි. මොහුගෙන් පසු ආයස්මත්ත නම් සෙනවියකු විසින් කරන ලද කුමන්ත්‍රණයක් මත කල්‍යාණවති බිසව තනතුරින් පහ කොට තෙමස් වයසැති බිළිඳු දරුවකු වූ **ධර්මාශෝක දේව** (ක්‍රි.ව. 1208-1209) කුමරු රජ කරවයි. (මහා වංසය. 80: 293) මෙම රජු වෙනුවෙන් **'ශ්‍රී ධර්මාශෝක දේව'** (කුලතුංග, 2002: 103) නමින් කාසි නිකුත් කර ඇති අතර මෙම කාසි ද පූර්ව කාසිවල මෙන් භෞතික ස්වරූපයන්ගෙන් වෙනස් ව නොමැත.

මෙම පාලන යුගයෙන් පසු කාලය බොහෝ අවුල් වියවුල්වලින් යුතු කාලයක් වූ අතර කාසි නිකුත් කිරිම පිළිබඳව සොයා බැලිමේ දි ගැටලු සහගත තැන් ද උද්ගත වේ. කෙසේ වෙතත් පොළොන්නරු අවධියෙන් පසුව ප්‍රධාන රාජධානිය  දඹදෙණිය ප්‍රදේශය තුළ ස්ථාපිත කරයි. මෙම යුගය ආරම්භ වන්නේ ක්‍රි.ව. 1232 දි **තෙවන විජයබාහු** (සුරවීර, 1997: 117) හෙවත් **වත්හිමි විජයබාහු**ගෙනි. ශ්‍රී විජයබාහු ලෙස සඳහන් කාසිවලින් කොටසක් හෝ මෙම රජු විසින් නිකුත් කරන්නට ඇතැයි ජෝන් ස්ටීල් ප්‍රකාශ කරයි (කුලතුංග, 2002: 105). මෙතුමා විසින් ගොඩනැංවූ

බෙලිගල දළදා මාලිගයේ තිබී රජවරු කිහිප දෙනෙකුට අයත් මධ්‍ය කාලීන යුගයේ කාසි හමුවන නමුත් මෙහුට අයත් කාසි හමු නො වීම විශේෂිත කරුණකි (එම).

මෙම රජුගෙන් පසුව බලයට පත් වන්නේ දෙවන පරාක්‍රමබාහු රජුය (ක්‍රි.ව. 1236-1270). (සුරවිර, 1997: 117) මහාවංසය තුළ පරාක්‍රමබාහු යන නාමයෙන් රජවරුන් කිහිප දෙනෙකු සඳහන් වන අතර ඉන් එක් අයෙකු වන්නේ මොහු ය. ශ්‍රී පරාක්‍රමබාහු ලෙස සඳහන් කාසිවල ලක්ෂණ දෙයාකාරයකින් හඳුනාගත හැකි ය. කාසිවල ඝණකම, විශ්කම්භය, ලෝහ සංයුතිය, සංකේත හා අක්ෂරවල වෙනස්කම් වන අතර එය කාසි විශේෂ දෙකක් හෝ රජවරුන් දෙදෙනෙකුගේ විය හැකි බව පිළිගනී (වික්‍රමසිංහ, 1999: 21). ඒ අනුව ශ්‍රී පරාක්‍රමබාහු ලෙස සඳහන් කාසිවලින් කොටසක් දෙවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1236-1270) රජු විසින් නිකුත් කළ ඒවා බවට සිතිය හැකි ය. මෙම කාසි ද පෙර රජුවරුන්ගේ කාසිවල මෙන් නාගරී අක්ෂරයෙන් ම නිකුත් කර ඇත.

මහාවංසය තුළ විජයබාහු නමින් රජවරුන් කිහිප දෙනෙකු පිළිබඳව සඳහන් වන අතර (වික්‍රමසිංහ, 1999: 23) මෙම රාජ්‍ය සමයේ ද මධ්‍ය කාලීන කාසි නිකුත් කිරීම සිදුව ඇත. එහෙත් කාසි නිකුත් කරන්නට ඇතැයි සිතිය හැක්කේ **හතරවන විජයබාහු** (ක්‍රි.ව. 1270-1272) රජුය. ඔහු විසින් **'ශ්‍රී විජයබාහු'** (කුලතුංග, 2002: 105) නමින් කාසියක් නිකුත්කර ඇත. කෙසේ වුවද මෙම ශ්‍රී විජයබාහු නමින් සඳහන් වන කාසිවල වෙනසකම් බොහෝමයක් දකගත හැකි ය. ඒ අතර කාසියේ බර, විශ්කම්භය, ලෝහය මෙන්ම රූප සටහන් හා අක්ෂරවල ද මුහුණෙහි ප්‍රමාණය අභිමුඛයේ ඇති රූපයේ අතහි ඇඟිලි සංඛ්‍යාව ආදිය වෙනස්කම් දැකගත හැකි ය (එම: 106). මෙම නිසා මේ පිළිබඳ ගැටලු සහගත තත්වයක් උද්ගත වේ. විජයබාහු නමින් සිටි අනෙක් රජවරුන් විසින් කාසි නිකුත් කිරීම, කාසි අච්චු ගැසීම ස්ථාන කිහිපයකදී සිදුවීම හෝ කාසි අච්චු වෙනසකට ලක්වීම සිදුවුවා ද යන්න අපහැදිලි ය.

මෙම රජුගෙන් පසුව බලයට පත්වන්නේ **පළමුවන බුවනෙකබාහු** (ක්‍රි.ව. 1272-1284) රජුය. මෙම කාසි මාලාවේ අවසාන රජු වශයෙන් හඳුනා ගත හැකි ය. මෙම රජු විසින් නාගරී අක්ෂරයෙන් **'ශ්‍රී බුවනෙකබාහු'** (කුලතුංග, 2002: 106) අභිධානය ඇතිව කාසි නිකුත් කළ බවට සාධක දකගත හැකි ය.

**සාරාංශය.**

පොළොන්නරු යුගයේ සිට දඹදෙණි යුගය දක්වා වන මධ්‍යකාලීන අවධිය තුළ එකම හැඩයේ හා එකම වර්ගයේ කාසි විවිධ වු පාලකයින් විසින් නිකුත් කර ඇති අතර එසේ කිරීමට බලපෑ ප්‍රධාන හේතු මොනවා ද යන්න සොයා බැලීම ද වැදගත් වේ. පොළොන්නරු යුගයේ සිට මෙම කාසිවල ස්වරූපය, රූප, සංකේත, ප්‍රමාණය ආදියෙහි මහත් වෙනසක් නොකොට අභිධානය සහිත අක්ෂර පමණක් වෙනස් ලෙස සඳහන් කරමින් වරින් වර විවිධ රජවරුන් විසින් නිකුත් කිරීම තුළින් පැහැදිලි වන එක් කරුණක් වනුයේ මෙම යුගය තුළ දි ලංකාවේ කාසි හෙවත් මුදල් පරිහරණය සම්බන්ධයෙන් ස්ථාවර ක්‍රමයක් භාවිත වන්නට ඇති බවයි. නැතහොත් මෙම යුගයේ පැවති රාජ්‍ය අස්ථාවර භාවය නිසාවෙන් රාජ්‍ය උරුමය කියා පෑම උදෙසා පෙර රජුගේ ක්‍රමය අනුගමනය කරමින් කාසි නිකුත් කර ඇති බවයි. කෙසේ වෙතත් මෙම කාසි

නිකුත් කිරිමේ සමාජිය, ආර්ථික, දේශපාලනික මෙන්ම මූල්‍යමය ආයතන ආදි කරුණු බලපාන්නට ඇතැයි සිතිය හැකි ය. කාසිය නිකුත් කිරිම ආර්ථික අවශ්‍යතාව මත පමණක්ම සිදුවී ද එසේත් නැත්නම් රාජ්‍ය බලය සඳහා විවිධ කණ්ඩායම් අතර වූ අරගල හේතුවෙන් තම ආධිපත්‍යය ජනතාව අතර පතුරුවාලීම සඳහා යොදා ගත් උපක්‍රමයක් ද යන්න තවදුරටත් විමසිය යුතු කරුණකි. කෙසේ වෙතත් ඉහත විමර්ශනයෙන් පැහැදිලි වන එක් කරුණක් වන්නේ මූල්‍යමය වශයෙන් කාසි නිෂ්පාදනයේ දි ඒකාකාරි වු කාසියක් දිර්ඝ කාලයක් මුළුල්ලේ ලංකාව තුළ භාවිතා වු බවයි. එය ඇතැම් විට මූල්‍ය ආයතන ක්‍රමයක ද තොරතුරු හෙළි කිරිමට සමත් වනවා ද යන්න විමසිය යුතුයි. මන්ද ඇතැම් විට මෙම කාසි රජුගේ අභිධානය හැරුණු විට වෙනත් පැහැදිලි වෙනසක් හඳුනාගත නො හැකි නිසා විශේෂ එක් ස්ථානයකින් දිගුකලක් මුළුල්ලේ මෙම ක්‍රියාවලිය සිදුවිම තුල එකල මූල්‍යමය වශයෙන් කාසි නිකුත් කිරිම හා ඒවා පරිහරණයට යෙදවිම රාජ්‍ය අනුග්‍රහයෙන් කරන්නට ඇතැයි සිතිම වැරදි සහගත නොවනු ඇත.

### ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය

***මහාවංසය.*** 1996: (සංස්.) ශ්‍රී සුමංගල නාහිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

***රාජාවලිය.*** 1997: (සංස්.) ඒ. වී. සුරවිර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

කුලතුංග, ටී. ජී. 2002. ***අභයගිරි ලිපි,*** කර්තෘ ප්‍රකාශන, තරංජී ප්‍රින්ට්ස්.

පරණවිතාන, එස්. 2012. ***සිංහලයෝ,*** විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

ධම්මවිසුද්ධි හිමි. යටදොළවත්තේ, කරුණානන්ද, යූ. බී. 2004. ***ඉන්දියාවේ ඉතිහාසය,*** අධ්‍යයාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

ඒකනායක, ඒ. 2011. ***ශ්‍රී ලංකාවේ පැරණි කාසි***, ඇස් . ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

බාලසූරිය, අයි. 2008. ***පැරණි මුදල්,*** මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

වික්‍රමසිංහ, එස්. 1998. ***වසුන්දරා හයවන කලාපය***, පුරාවිද්‍යා අධ්‍යන සංගමය, කැළණිය.

Key word, sri lanka coin. retrieved on 2013.08.23from *http://www.Central bank of sri lanka web*